2024-08-



# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## ඉතිහාසය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය : ........................................

| 7 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

11 කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ගොඩ ගොවිතැන ලෙස හඳුන්වන්නේ
(i) කුඹුරු ගොවිතැන (ii) මඩ ගොවිතැන (iii) කෘෂිකර්මාන්තය (iv) හේන් ගොවිතැන

(02) ගම් වැව් යනු
(i) වැවක් පවතින ගම් (ii) වැව් පද්ධතියක් පවතින ගම්
(iii) භාවිත නොකරන වැවක් ඇති ගම් (iv) වැව් දෙකක් පමණක් පවතින ගම්

(03) මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වූ රජතුමා වන්නේ
(i) වසභ රජතුමා (ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමා
(iii) නිශ්ශංකමල්ල රජතුමා (iv) මහසෙන් රජතුමා

(04) වී පරිහරණයට ගන්නා තෙක් ආරක්ෂා සහිතව තැන්පත් කිරීම සඳහා භාවිත කර ඇත්තේ
(i) කමත (ii) වී බිස්ස (iii) කුඹුර (iv) හේන

(05) ගෝපාල ගම් ලෙස හැඳින්වූයේ
(i) මැටි කර්මාන්තයේ නියැළෙන්නන් විසූ ගම් (ii) ධීවරයන් විසූ ගම්
(iii) ගවයන් රැක බලා ගන්නන් විසූ ගම් (iv) ගොවිතැන් කරන්නන් විසූ ගම්

(06) අත්තම් ක්‍රමය යනු
(i) භාණ්ඩයට භාණ්ඩය හුවමාරු කර ගැනීමේ ක්‍රමය (ii) ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීමේ ක්‍රමය
(iii) සාමූහිකව වැඩ කටයුතු කිරීමේ ක්‍රමය (iv) තම කාර්යන් තමා විසින් ඉටු කර ගැනීමේ ක්‍රමය

(07) සූප ශාස්ත්‍රයෙන් දක්ෂ කාන්තාවක් හඳුන්වා ඇත්තේ
(i) මධුරාසා (ii) මධුපානා (iii) මධුරාසිකා (iv) මධුපාචිකා

(08) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු විශාල හමුදාවක් සමග මෙරට ආක්‍රමණය කළේ කුමන රජතුමාගේ කාලයේද?
(i) පළමුවන සේන රජුගේ (ii) පළමුවන විජයබාහු රජුගේ
(iii) දෙවන සේන රජුගේ (iv) නිශ්ශංකමල්ල රජුගේ

(09) කුඩා ම පරිපාලන ඒකකය වන්නේ
(i) නගරය (ii) ප්‍රදේශය (iii) දිස්ත්‍රික්කය (iv) ගම

(10) පළමුවන විජයබාහු රජුට කුඩා කළ රැකවරණය සපයන ලද ප්‍රභූවරයා වන්නේ
(i) මහාසාමි මොග්ගල්ලාන (ii) වික්‍රමබාහු (iii) බුද්ධරාජ (iv) බුද්ධදාස

(11) මානවම්ම රාජ්‍ය සමයට පෙර මෙරට පැවති දේශපාලන තත්ත්වයක් වන්නේ
(i) සමෘද්ධිමත් ආර්ථිකයක් පැවතීම.
(ii) අභ්‍යන්තර ගැටුම් නිසා රටේ ස්ථාවර පාලනයක් බිහි නො වීම.
(iii) සාමකාමී දේශපාලන වාතාවරණයක් පැවතීම.
(iv) සතුරු ආක්‍රමණයන්ගෙන් තොරවීම.

(12) අනුරාධපුර යුගය අවසාන භාගයේ දී රජවරු හෝ උසස් නිලධාරීන් යම් යම් පුද්ගලයන්ට හා ආයතනවලට විශේෂ බලතල හා වරප්‍රසාද පවරා දීමේ දී මහජනතාව දැනුම්වත් කිරීමට ලේඛන ලියා ඇත්තේ
(i) ගාවුත කණුවල (ii) ස්ථම්භවල (iii) අන්තානි කණුවල (iv) ශිලා කණුවල

(13) පාලන කටයුතුවල දී මෙන් ම අය බදු පැනවීමේ දී රජු ක්‍රියා කරන ලද්දේ කුමකට අනුවද?
(i) මහාවංශයට (ii) පෙරසිරිතට (iii) සෙල්ලිපිවලට (iv) බුදු දහමට

(14) පල්ලව රාජ්‍යයේ අගනුවර වන්නේ
(i) කාංචිපුරය (ii) තන්ජෝරය (iii) මදුරාපුරය (iv) කාශ්මීරය

(15) පොළොන්නරුවේ කිරි වෙහෙර කරවූ රජතුමා වන්නේ
(i) පළමුවන විජයබාහු රජු (ii) මහා පරාක්‍රමබාහු රජු (iii) නිශ්ශංකමල්ල රජු (iv) දෙවන සේන රජු

(16) ලෝක සංස්කෘතික උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානය නම් කර ඇති මොහොන්ජොදාරෝ නගරය වර්තමානයේ අයත් රට වන්නේ
(i) ඉරාකය (ii) චීනය (iii) ඉන්දියාව (iv) පකිස්ථානය

(17) සීගිරිය නිර්මාණය කර ඇති රජතුමා වන්නේ
(i) දුටුගැමුණු රජු (ii) පළමුවන කාශ්‍යප රජු (iii) පණ්ඩුකාභය රජු (iv) වසභ රජු

(18) ජනතාව එකතු වී පවත්වන පොදු උත්සවයක් නොවන්නේ
(i) වෙසක් උත්සවය (ii) ජල ක්‍රීඩා උත්සවය (iii) වප්මගුල් උත්සවය (iv) කර්ණවේදන උත්සවය

(19) වෙස් මුහුණු නිර්මාණය සඳහා ප්‍රසිද්ධියට පත්ව ඇති ප්‍රදේශයක් වන්නේ
(i) ගාල්ල (ii) අම්බලන්ගොඩ (iii) මාතර (iv) හික්කඩුව

(20) අපි අපේ සංස්කෘතික උරුම රැක ගත යුතු වන්නේ
(i) විනෝද ගමන් සංවිධානය කිරීම සඳහාය.
(ii) රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහාය.
(iii) ඒවා විදේශ රටවලට විකුණා මුදල් උපයා ගැනීම සඳහාය.
(iv) ශ්‍රී ලාංකික අනන්‍යතාව ලෝකය හමුවේ පෙන්වීමටත් අපේකම රැක ගැනීමටත්ය.

## 11 කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.

(01) අ) පහත සිතියමේ දී ඇති අක්ෂර වලට අදාළ නම් පහත සඳහන් ලයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළ අක්ෂරයඉදිරියෙන් ලියන්න. (ලකුණු 06)

(1) පොළොන්නරුව
(2) මිණිපේ අමුණ
(3) කොළඹ
(4) අනුරාධපුරය
(5) යාපනය
(6) මහවැලි ගඟ



ආ) පහත දැක්වෙන පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න. (ලකුණු 06)



1. (i) මෙහි දැක්වෙන්නේ කුමක්ද?
   (ii) මෙය පිහිටා ඇත්තේ කුමන රටේද?
   (iii) මෙය ගොඩනගා ඇත්තේ කුමක් සඳහාද?



2. (i) මෙහි දැක්වෙන්නේ කුමක්ද?
   (ii) මෙය ඉදිකර ඇත්තේ කවුද?
   (iii) මෙය ගොඩනගා ඇත්තේ කුමන යුගයේද?

(02) 1. පුරාණ ජීවන රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

2. පැළ සිටුවීමේ සිට අස්වනු නෙළා ගන්නා තෙක් ගොයම ආරක්ෂා කර ගැනීමට භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රම 02ක් ලියන්න. (ලකුණු 02)

3. පහත දැක්වෙන ප්‍රශ්න සඳහා වරහන් තුලින් පිළිතුරු තෝරා ලියන්න. (ලකුණු 03)
   (පිටිබිම්, ගිනි යාතිකාව, නවදැලි හේන, හැලි කටා, කුරුළු පාලුව)
   (i) අලුතින් ගිනිතබා සකස් කළ හේන
   (ii) හේන ගිනිතැබීමට පෙර සතුන් පන්නා හැරීමට සිදු කළ කෑ ගැසීම
   (iii) හිසට වළඳක් දමා සාදා ගන්නා ලද පඹයා

4. හේනක් සඳහා බිම සකස් කර ගන්නා ආකාරය දක්වා හේනක වගා කරන බෝග හා හේන් වගාව සඳහා භාවිත කරන උපකරණ පිළිබඳව කෙටියෙන් විස්තර කර ලියන්න. (ලකුණු 05)

(03) 1. සත්ව පාලනය යටතේ ඇති කරන ලද සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

2. සතුන්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජන නම් 02ක් කරන්න. (ලකුණු 02)

3. ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

| කර්මාන්තය | ශිල්පීන් |
|---|---|
| ලෝහ | ..................................... |
| ..................................................... | කුම්බකාර |
| කපු | ..................................... |

4. (i) අතීතයේ මෙරට පැවති වෙළෙඳාමේ ප්‍රධාන ආකාර 02ක නම් කරන්න. (ලකුණු 02)
   (i) ඉහත සඳහන් ආකාර දෙකෙන් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) 1. අනුරාධපුරය රාජධානිය කොට ගත් රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

2. පොළොන්නරුව රාජධානිය කොට ගත් රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

3. පහත සඳහන් රජවරු අයත් රජ පෙළපත වරහන් තුළ දක්වා ඇති පිළිතුරුවලින් තෝරා ලියන්න. (ලකුණු 03)
   ( කාලිංග, මෞර්ය, පාණ්ඩ්‍ය, මානවම්ම, ලම්බකර්ණ)
   (i) වසභ රජතුමා
   (ii) ධාතුසේන රජතුමා
   (iii) පළමුවන සේන රජතුමා

4. රටේ මධ්‍යම පාලනයේ ඉහළම තැනැත්තා වන රජුට අයත් කාර්යය 02ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) 1. අනුරාධපුර යුගයේදී ප්‍රාදේශීය පරිපාලනයට සහය වූ තනතුරු 02ක් නම් කරන්න. (ලකුණු 02)

2. අනුරාධපුර යුගයේදී ක්‍රියාත්මක වූ නීති වර්ග 02ක් නම් කරන්න. (ලකුණු 02)

3. පහත සඳහන් කාර්යයන් සඳහා දායක වූ රජවරුන් නම් කරන්න. (ලකුණු 03)
   (i) සෑම ගම් දහයකට ම වෛද්‍යවරයෙකු බැගින් පත් කොට වෙදහල් කරවීම.
   (ii) මූල්‍ය කළමණාකරණයේ වැදගත් ලේඛනයක් වන මිහින්තලේ පුවරු ලිපිය කරවීම.
   (iii) පස්දුන් කෝරලයේ වගුරු බිම්වල ජලය බැස්සවා එම බිම් සංවර්ධනය කරවීම.

4. අනුරාධපුර රාජධානිය පරිහානියට පත්වීමට කරුණු 02ක් දක්වා එක් කරුණක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) 1. ශ්‍රී ලංකාව කෙරෙහි සෘජු බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජධානි 02ක් නම් කරන්න. (ලකුණු 02)

2. පළමුවන විජයබාහු රජු පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර 02ක් නම් කරන්න. (ලකුණු 02)

3. නිශ්ශංකමල්ල රජතුමාගේ කාර්යයන් 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

4. මහා පරාක්‍රමබාහු රජතුමාගේ සේවා 02ක් නම් කර ඉන් එකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) සංස්කෘතික උරුමයන් යනු මොනවාද? (ලකුණු 02)

(ii) ස්පෘශ්‍ය උරුමයන් සඳහා උදාහරණ 02ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) අස්පෘශ්‍ය උරුමයන් සඳහා උදාහරණ 03ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iv) a. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම 03ක් සඳහන් කරන්න

b. ඔබ නම් කළ එක් ස්ථානයක වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

REGISTRAR
De Mazenod College
Kandana.